RARE

# විද්‍යුත් මාධ්‍ය භාවිතය සහ චර්යාමය වෙනස

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සිංහල ස්වදේශීය සේවයෙන් ප්‍රචාරය වූ මැන්ඩෙලා ගීතය සහ ධර්මපාල පුනරාගමනය යන චරිතාපදාන හඬ නළු දෙක ඇසුරින්

නම එච්. ආර්. එස්. එස්. පීරිස්

ශිෂ්‍ය අංකය MACO/R/50/98

සමාජීය විද්‍යාපති ජනසන්නිවේදන උපාධියෙහි අවශ්‍යතාවක් පූරණය කරනු පිණිස කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනයකි.

ප්‍රවේශ අංකය: 1250
වර්ග අංකය:

වර්ෂය 2015

සාරාංශය

කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජයීය විද්‍යාපති උපාධි පාඨමාලාව වෙනුවෙන් ඉදිරිපත් කරණු ලබන නිබන්ධනයකි.

විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් ග්‍රාහක චර්යාමය වෙනසක් සිදුවන්නේද? (මැන්ඩෙලා ගීතය හා ධර්මපාල පුනරාගමනය අපදනොත්මක හඬ නළු දෙක ඇසුරින්) සොයා බැලීම නිබන්ධනයේ ගැටලුවයි.

දහනමවන සියවසේ මුල් භාගයේ ලොවට හඳුන්වා දෙන ලද සුවිශේෂී උපකරණය ගුවන්විදුලි මාධ්‍යයි. විද්‍යුතයේ ප්‍රසාරණයක් වූ මෙම සන්නිවේදන ප්‍රවාහයේ ආමන්ත්‍රණය එක් පුද්ගලයෙකු වටා කේන්ද්‍රිය වී ඇත. එබැවින් මිනිස් ප්‍රපංචයන්හි ඇති කරන බලපෑම අධ්‍යයනය පහසු නොවේ. මනෝ විද්‍යාඥයන් පවා මනසේ ක්‍රියාකාරිත්වය සම්බන්ධව අවධානය යොමු කර තිබෙන්නේ 1950 දශකයේදී ය. ඒ නූතන වාග් විද්‍යාවේ දියුණුවත් සමඟයි. භාෂාව ග්‍රහණය කර ගැනීමට සහ කතා කිරීමට මානසික ව්‍යුහයන්ගේ බලපෑම සිදුවන බව මනෝ විද්‍යාඥ නෝම් චොම්ස්කිගේ මත ඉදිරිපත්වීමත් සමඟ චර්යාව පිළිබඳව නූතන චර්යාවාදීන් මනසේ ක්‍රියාකාරිත්වය අධ්‍යයනයට යොමු වූහ. ගුවන්විදුලිය මනෝ මූලික සන්නිවේදන ක්‍රමයකි. ඒ හරහා සමාජීය වශයෙන් ඇති කරන බලපෑම අධ්‍යයනයට කිසිවෙකුත් උත්සාහ ගෙන නැත. එබැවින් විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් ග්‍රාහක චර්යාව වෙනස් කිරීමට බලපෑමක් ඇති කරයි යන උපකල්පනය තුළ සිට පර්යේෂණය සිදු කරන ලදී.

ගුවන්විදුලි මාධ්‍ය ප්‍රබලත්වය මෙන්ම මානසික ප්‍රපංචයන්ට ඇති කරන බලපෑම මෙහි විග්‍රහ කර ඇත. චර්යාවේ ස්වභාවය හඳුනා ගැනීම සහ චර්යාවාදීන් මෙන්ම චර්යාව සම්බන්ධව කර ඇති නිර්වචන, කාල්මාක්ස්, ඒංගල්ස්, වී.අයි. ලෙනින් වැනි විද්වතුන් චර්යාව සම්බන්ධව දක්වා ඇති අදහස් හා මතවාද මෙහි දක්වා ඇත. එමෙන්ම ජනමාධ්‍යවේදය සම්බන්ධව පුද්ගල විවිධත්වය ගොඩනැගීමේදී බලපා ඇති මනෝ විද්‍යාත්මක සංකල්ප පිළිබඳ විමසීමක් කරන ලදී. ප්‍රජානන මනෝ විද්‍යා ක්ෂේත්‍රය මඟින් මානසික ප්‍රපංචයන් හා මානසික ව්‍යුහයන් පිළිබඳ විද්‍යාත්මක විශ්ලේෂණ මෙන්ම මනස පිළිබඳව බෞද්ධ දර්ශනයේ දක්වා ඇති අදහස් ද නිබන්ධයට ඇතුළත් වේ.

ගුවන්විදුලි හඬ නළුවේ ආරම්භය සහ විකාශනය මෙන්ම හඬ නළුවක සහ චරිතාපදාන හඬ නළුවක සුවිශේෂීතා මෙහි සඳහන්ය. ගුවන්විදුලි මාධ්‍යයේ ඇති ප්‍රබලතා, දුබලතා, ගුවන්විදුලි වැඩසටහනක් නිෂ්පාදනය සම්බන්ධ කරුණු මෙන්ම චරිතාපදාන සම්බන්ධ චරිතවල ජීවන තොරතුරු අධ්‍යයනය කළෙමි. එමෙන්ම ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ශ්‍රවණ පර්යේෂණ අංශය සිදු කර ඇති ශ්‍රවණ පර්යේෂණ වාර්තාවල දත්ත ඇසුරින් චර්යාත්මක වෙනස සිදුව ඇති ආකාරය විග්‍රහ කිරීමට කටයුතු කරන ලදී.

පර්යේෂණ අධ්‍යයනයට යොමු වූ චරිතාපදාන හඬ නළු දෙක ශ්‍රාවක මනසේ රැඳී තිබූ චරිත කතාය. නිර්මාණාත්මකව ගොඩනැගුණු මෙම චරිත කතා ශ්‍රාවකයාගේ මනස උත්තේජනයට පත් කර ඇත. එය හුදෙක් විනෝදාස්වාදයට පමණක් සීමා වූවක් නොවේ. තවදුරටත් අධ්‍යයනයට ශ්‍රාවකයා පොළඹවයි. එය වයස් භේදයකින් තොරව සිදු වන්නකි. ඒ අනුව පුද්ගල චර්යාව වෙනස් කිරීම සඳහා විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් හේතු වන බව නිගමනය විය. මේ අනුව පර්යේෂණ අධ්‍යයනය සඳහා හේතු වූ උපන්‍යාසය තහවුරු විය.

මූරපද : ප්‍රපංචය" හඬ නළුව" චර්යාව" මෙන්ඩෙලා" ධර්මපාල

**The Abstract**

The dissertation presented for the Social Science Master Degree of the University of Kelaniya.

Will there be a change in the customer behavior pattern from the usage of the electronic media.? The research problem of the dissertation is to examine whether there will be a change in the behavior pattern of the subscriber / listener by using the electronic media in association with (the Mandala song and Dharmapala reincarnation from the radio play).

During the first half of the nineteenth century, the special instrumental device supplied to the world, is the broadcasting medium through the radio. Through that the expansion of the electronic communication, has got centered round the individual. Therefore, the impact on human phenomenal is an arduous task to make a study. Even the psychologists have drawn attention towards the working of the mind during the decade of the nineteen fifties (1950s). That was the area with the development of the modern linguistics with surfacing of Thome Choskys's ideas and views how the modern behaviorists got engaged in the study of the minds activities. Radio is a mentally based communication methodology. Therefore, the study was launched basing on the assumptions on origin of the programs of the electronic media influence, for the change of the subscriber / listener behavior pattern.

Here, it has been analyzed that the radios broadcasting medium forceful impact and the influence it could have on the mental phenomenal. Identification of the nature of behavior pattern that the definitions that had been put forward by the learned personnel such as Karl Marx, Engels and V.I. Lenin have been shown here. Also in building u the personal diversities of opinions and the concepts that had influenced those had been inquired into. Through the procreation psychological field, the scientific analysis of the mental phenomenal as well as the mental structure and also the idea given in Buddhist philosophy with regard to the mind are included to the dissertation.

In it mention has been made on the origin of the radio play as well as the specialty of the radio play programme and that characterization radio play. I have included in my study forcefulness of the broadcasting media and its weaknesses and the facts regarding the production of radio programmes as well as the characterization and the life stories of the characters depicted. Also action is taken to analyze the data collected from the listener and research work and the change that had taken place in behavioral pattern of the Listener Research Unit of the Sri Lanka Broad Casting Corporation.

Two characterization radio play taken up for research study were the life stories which have been built up creatively had energized the minds of the listener. It had not limited purely, for the purpose of emanating pleasure. Further, the listener is persuaded to the study and it happens devoid of age differences. Thereby came to the conclusion that the electronic media programmers cause the differentiation of individual behavior pattern. On that basis the assumptions of the research got confirmed.

**The Key words:** Phenomenal, Radio play, Behavior pattern, Mendala, Dharmapala